Australian Government
Department of Home Affairs

ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය අතර නිරෝධායන නිදහස් ගමන් 2021 අප්‍රේල් 18 වන දින AEST 21:59 ට ආරම්භ වේ. ඕස්ට්‍රේලියාවේ හෝ නවසීලන්තයේ දින 14 ක් ගත කර ඇති **සියලුම මගීන්ට** ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය අතර සංචාරක ගමන් සහනයක් සඳහා ඉල්ලුම් කිරීමේ අවශ්‍යතාව නොමැතිව නිරෝධායනය රහිතව ගුවන් ගමන් කළ හැකිය.

දින 14 ක්ම ආරක්ෂිත සංචාරක කලාපයේ ගත කළ සංචාරකයින් **හෝ** දෙරට අතර සංචාරය කර දින 14 ක කාලය තුළ නැවත පැමිණෙන සංචාරකයින් මෙයට ඇතුළත් වෙති.

ඕස්ට්‍රේලියාවේ හෝ නවසීලන්තයේ වෙසෙන (විදේශිකයන් ද ඇතුළුව) සියලු දෙනාට එක් එක් රටක සෞඛ්‍ය, සංක්‍රමණ සහ අනෙකුත් සම්මත දේශසීමා නිෂ්කාශන අවශ්‍යතා සපුරාලන තාක් කල් නිරෝධායනය රහිත සංචාර භාවිත කළ හැකිය.

නිරෝධායන අවශ්‍යතා යම් යම් තත්ත්ව යටතේ අදාළ විය හැකි බැවින් සියලුම මගීන් ඔවුනොවුන්ගේ පැමිණීමේ ස්ථානය සහ ඔවුන්ගේ අවසාන ගමනාන්තය පිළිබඳ විධිවිධාන පරීක්ෂා කළ යුතුය.

නවසීලන්තයේ සෞඛ්‍ය සහ සංක්‍රමණ අවශ්‍යතා ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය: නවසීලන්තයේ නිරෝධායන රහිත සංචාර අවශ්‍යතා

වැඩි විස්තර සඳහා, ඕස්ට්‍රේලියානු රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය බලන්න: ජාත්‍යන්තර සංචාරකයින් සඳහා වන කොරෝනා වෛරස් (COVID-19) උපදෙස්

**සටහන**: ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ COVID-19 තත්ත්වයේ යම් වෙනසක් සිදුවුවහොත් දැනුම්දීමකින් තොරව නිරෝධායන රහිත ගමන් විධිවිධාන විරාම කිරීමට හෝ අත්හිටුවීමට හේතු විය හැක. ඔබගේ ඕස්ට්‍රේලියාවට නැවත පැමිණීම ප්‍රමාද වුවහොත් ඇතුළුව ඔබගේ සංචාරක සැලසුම්වලට යම් බාධාවක් සිදු වූවහොත් එයට විකල්පය සෙවීමේ වගකීම ඔබ සතුය.

# නවසීලන්තයෙන් පිටත වැසෙන නවසීලන්ත පුරවැසියන්

නිරෝධායන රහිත සංචාරය නවසීලන්තයෙන් පිටත සිටින නවසීලන්ත පුරවැසියන්ට හෝ ඕස්ට්‍රේලියාවට යාමට පෙර වහා දින 14 ක් නවසීලන්තයේ නොසිටි අය සඳහා අදාළ **නොවේ**.

# COVID-19 අවදානම් ස්ථාන

සැලකිලිමත් විය යුතු නවසීලන්ත ස්ථාන ලැයිස්තුවක් සඳහා ඕස්ට්‍රේලියානු සංචාරක ප්‍රකාශන පිටුව බලන්න. නිශ්චිත කාල සීමාව තුළ ඔබ මෙම කිසියම් ස්ථානයකට ගොස් ඇත්නම්, ඔබට ඔබේ ඕස්ට්‍රේලියානු සංචාරක ප්‍රකාශනයේ මෙය හඳුනා ගැනීමට අවශ්‍ය වෙයි.

# නිරෝධායනයෙන් නිදහස්ව නවසීලන්තයේ සිට ඕස්ට්‍රේලියාව දක්වා යාම

බ ඕස්ට්‍රේලියාවට යාමට පෙර, ඔබ ඕස්ට්‍රේලියාව බලා පිටත්ව යාමට අවම වශයෙන් පැය 72 කට පෙර ඕස්ට්‍රේලියානු සංචාරක ප්‍රකාශය සම්පූර්ණ කළ යුතුය.

ඕස්ට්‍රේලියානු සංචාරක ප්‍රකාශනය තුල ඕස්ට්‍රේලියාවේ ඔබගේ සම්බන්ධතා තොරතුරු, ගුවන් ගමන් විස්තර, නිරෝධායන අවශ්‍යතා සහ ඔබේ සෞඛ්‍ය තත්ත්වය අඩංගු වේ.

මෙම තොරතුරු ඕස්ට්‍රේලියානු රජයට ඔබේ නිරෝධායන විධිවිධාන තීරණය කිරීමට (අවශ්‍ය නම්) උපකාරී වේ. තවද COVID-19 පරීක්ෂණයෙන් ආසාදිතයෙකු ලෙස තහවුරු කෙරෙන්නේ නම් ඔබ සමඟ සංචාරය කළ අය සොයා ගැනීමට සහ සම්බන්ධ වීමට අදාළ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවලට ඉඩ සලසයි.

ඔබ **ගුවන් ගමන්** මගින් ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නේ නම් සහ ඔබ සංචාරය කිරීමට පෙර දින 14 ක් හෝ ඊට වැඩි කාලයක් ඕස්ට්‍රේලියාවේ හෝ නවසීලන්තයේ සිට තිබේ නම්, ඕස්ට්‍රේලියාවේ සංචාරක සීමා සඳහා ගමන් සහනයක් සඳහා ඉල්ලුම් කිරීමට **අවශ්‍ය නොවේ**. ඔබ ස්වයංක්‍රීයව නිදහස් වේ.

ඉහත නිර්ණායක සපුරාලන්නේ නම් නවසීලන්තයේ සිට නිරෝධායනයෙන් තොරව ඕස්ට්‍රේලියාවට යාමට ඔබ නවසීලන්ත පුරවැසියෙකු වීමට අවශ්‍ය නැත, නමුත් ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට ඔබට **වලංගු වීසා බලපත්‍රයක් අවශ්‍ය වේ**. නවසීලන්ත පුරවැසියන්ට ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය නොවේ. සුදුසුකම් ලැබුවහොත් ඔවුන්ට පැමිණෙන විට විශේෂ කාණ්ඩයේ වීසා බලපත්‍රයක් (උප පංතිය 444) (SCV) දෙනු ලැබේ.

ඔබට ඉල්ලුම් කිරීමට අවශ්‍ය වන්නේ ඔබ ඕස්ට්‍රේලියාවට යාමට පෙර ගමන් සහනයක් සඳහා පමණි. ඒ සඳහා අවශ්‍ය වන්නේ:

- ඔබ සැලසුම් කිරීමට පිටත්වීමට දින 14 කට අඩු කාලයක් (නවසීලන්තය සංක්‍රමණය කරන සංචාරකයින් ද ඇතුළුව) ඔබ ඕස්ට්‍රේලියාවේ හෝ නවසීලන්තයේ සිටීම, නැතිනම්
- ඔබ මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට යාමට අදහස් කිරීම.

# නිරෝධායනයෙන් නිදහස්ව ඕස්ට්‍රේලියාව සිට නවසීලන්තය දක්වා යාම

ඔබ ඉහත සඳහන් නිර්ණායක සපුරාලන්නේ නම් ඕස්ට්‍රේලියාවේ සිට නවසීලන්තයට ගමන් කිරීමට ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙක් හෝ ස්ථිර පදිංචිකරුවෙක් වීමට අවශ්‍ය නැත. කෙසේ වෙතත්, ඔබ නවසීලන්ත රජයේ සෞඛ්‍ය පූර්ව කොන්දේසි සහ සියලුම සම්මත ආගමන, රේගු සහ ජෛව ආරක්ෂණ ඇතුළු වීමේ අවශ්‍යතා සපුරාලිය යුතු ය.

# ඕස්ට්‍රේලියාවේ සිට නවසීලන්තය දක්වා ගමන් කිරීම: ගමන් සහන අවශ්‍යතා

ඔබ නවසීලන්තයට සෘජුවම ගමන් කරන්නේ නම් සහ ඔබ පිටත්ව යාමට දිනට පෙර දින 14 ක් ඔබ ඕස්ට්‍රේලියාවේ හෝ නවසීලන්තයේ සිට තිබේ නම්, ඔබට ඕස්ට්‍රේලියාවේ සංචාරක සීමා සඳහා ගමන් සහනයක් ඉල්ලුම් කිරීමට අවශ්‍ය **නොවේ***. ඔබ ස්වයංක්‍රීයව නිදහස් වේ.

*ඕස්ට්‍රේලියානු පුරවැසියන් සහ ස්ථිර පදිංචිකරුවන් නවසීලන්තයට යාමට පෙර බාහිර සංචාරක නිදහස් කිරීමක් සඳහා ඉල්ලුම් කිරීමට **අවශ්‍ය වන්නේ**:

- ඔබ නවසීලන්තයේ සිට වෙනත් විදේශීය ගමනාන්තයක් වෙත ඉදිරි **ගුවන් ගමනක් වෙන් කරවා** ගෙන ඇති නම්

නවසීලන්තයේ සිට වෙනත් ජාත්‍යන්තර ගමනාන්තයක් දක්වා ගමන් කරන අය ඕස්ට්‍රේලියාවට හෝ නවසීලන්තයට ආපසු යාම දුෂ්කර විය හැකි බව දැන සිටිය යුතුය. මීට හේතුව මගී අංක සඳහා දැනට පවතින සීමා සහ ගුවන් ගමන් සීමිත වීම නිසාය.

ඔබ නවසීලන්තයේ සිට වෙනත් ජාත්‍යන්තර ගමනාන්තයක් වෙත ගොස් නැවත ඕස්ට්‍රේලියාවට යාමට උත්සාහ කරන අයෙකු නම්:

- ඕස්ට්‍රේලියාවට යාමට පැය 72 ක් තුල ආසාදනය වැළඳී නොසිටි බවට COVID-19 පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම
- තමන්ගේ වියදමින් දින 14 ක අනිවාර්ය හෝටල් නිරෝධායනයක් ඇතුළත් කර ගැනීම, සහ
- අනිවාර්ය නිරෝධායනය අතරතුර කලින් කල පරීක්ෂා කර ගැනීම.

ඕස්ට්‍රේලියාවට ආපසු ඒම තුළින් හා බොහෝ රටවල COVID-19 වෙතින් ඇති විය හැකි බලපෑම් ඇතුළුව මේ අවස්ථාවේදී විදේශ සංචාර හේතුවෙන් ඇති විය හැකි අවදානම් ඉහළ මට්ටමක පවතී.

# ඕස්ට්‍රේලියාව හරහා නවසීලන්තයට ගමන් කිරීම

ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීමට අපේක්ෂා කරන සංචාරකයින්ට මූලික කලාපයෙන් පැය 72 කට නොඅඩු කාලයකින් ඕස්ට්‍රේලියාවෙන් රතු කලාප ගුවන් යානයකින් පිටත්ව යන ඉදිරි ටිකට් පතක් ලබා ගත හැකිය. **සුදුසු සම්බන්ධක රතු කලාප ගුවන් ගමනක් සඳ ගුවන් යානයක් නොමැති නම්, ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීමට නොහැකි වෙයි.** ඕස්ට්‍රේලියාව සංක්‍රමණය කිරීම පිළිබඳ වැඩි විස්තර ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රාන්ති වීම වෙබ් පිටුවෙන් සොයාගත හැකිය.

# ඕස්ට්‍රේලියාවට පැමිණීම

දින 14 ක අනිවාර්ය නිරෝධායනයකට ඇතුළු විය යුතු අනෙකුත් මගීන්ගෙන් නිරෝධායන රහිත ගුවන් ගමන් සඳහා පැමිණෙන මගීන් වෙන් කිරීම තහවුරු කිරීම සඳහා ඕස්ට්‍රේලියානු ගුවන් තොටුපලවල කොළ හා රතු කලාප නිර්මාණය කර ඇත.

ඔබ නිරෝධායන රහිත ගුවන් යානයකින් පැමිණෙන්නේ නම්, ඕස්ට්‍රේලියාවට පැමිණෙන ගුවන් තොටුපලේ දේශසීමා නිෂ්කාශන ක්‍රියාවලි සියල්ල සම්පූර්ණ කිරීම සඳහා කොළ කලාපයක් හරහා යාමට ඔබට මඟ පෙන්වනු ලැබේ.

නිරෝධායන රහිත ගුවන් ගමන් සඳහා පැමිණෙන සංචාරකයින් සඳහා වැඩිදුර තොරතුරු සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය බලන්න.